සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2016
இரண்டாம் தவணைப் பரீட்சை 2016
Second Term Test 2016

6 ශ්‍රේණිය
தரம் 6
Grade 6

ගණිතය
கணிதம்
Mathematics

පැය දෙකයි.
இரண்டு மணித்தியாலம்
Two Hours

II කොටස

(ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම ලකුණු 12 බැගින් ලැබේ.)

(01) a) වෙළඳ සැලක ප්‍රදර්ශනය කර ඇති මිළ ගණන් සහිත පුවරුවක් පහත දැක්වේ.

ද්‍රව්‍ය	මිල
සම්බා හාල් 1kg	රු 90.00
සීනි 1kg	රු 110.00
මයිසූර් පරිප්පු 1kg	රු 180.00
තේ කොළ 1kg	රු 600.00
ඇන්කර් කිරි පැකට් 1	රු 325.00

i. සම්බා සහල් 2kg මිල සොයන්න.

ii. සම්බා හාල් 2kg ක් හා තේ කොල 100g ක් මිලදී ගත් අයෙකු ගෙවිය යුතු මුළු මුදල සොයන්න.

b) i. හිස්තැන් පුරවමින් $\frac{1}{3}$ ට තුල්‍ය භාග 2ක් ලියන්න.

අ) $\frac{1}{3} = \frac{1\times4}{3\times4} = \frac{4}{\square}$ ආ) $\frac{1}{3} = \frac{5}{\square}$

ii. සුළු කරන්න.

$$\frac{1}{3} + \frac{2}{15} =$$

c) i. $\frac{25}{100}$ මෙම භාගය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

ii. එය කියවන ආකාරය වචනයෙන් ලියන්න.

iii. සුළු කරන්න

$$\begin{array}{r} 2.53 \\ \underline{9.64} + \\ \hline\hline \end{array}$$

(02) 45 604 768 983

i. ඉහත සංඛ්‍යාව කියවන ආකාරය වචනයෙන් ලියන්න.

ii. මෙහි 8 න් නිරූපණය වන අගයන් ලියන්න.

iii. ඉහත ii කොටසෙහි ලැබුණු අගයන් අතරින් විශාල සංඛ්‍යාවේ අගය කුඩා සංඛ්‍යාවේ අගය මෙන් කී ගුණයක්ද?

iv. දී ඇති සංඛ්‍යාවේ දහස් කලාපය ලිවීමට භාවිත කර ඇති ඉලක්කම් මොනවාද?

v. එම ඉලක්කම් එක්වරක් පමණක් භාවිත කරමින් ලිවිය හැකි විශාල ම සංඛ්‍යාව ලියන්න.

vi. ඔබට පිළිතුර ලෙස ලැබුණ සංඛ්‍යාවේ අග ඉලක්කම් දෙකෙන් දැක්වෙන සංඛ්‍යව ආසන්න 10 ට වටයා ලියන්න.

(03) (a) i. 12 සාධක යුගලවල ගුණිත ලෙස දක්වමින් හිස්තැන් සම්පූර්ණ කරන්න.



ii. 12 හි සාධක සියල්ල ම ලියන්න.

iii. 2 හා 5 යන ඉලක්කම් දෙකෙන් ම ඉතිරි නැතිව බෙදෙන සංඛ්‍යා දෙකක් ලියන්න.

b) i. 1 සිට 15 තෙක් ඇති සංඛ්‍යා සියල්ල ම ලියන්න.

ii. එම සංඛ්‍යා අතරේ ඇති ඉරට්ට සංඛ්‍යා වටා රවුම් අඳින්න

iii. එහි ඇති ප්‍රථමක සංඛ්‍යා වටා කොටු අඳින්න.

iv. එම සංඛ්‍යා අතරින් ප්‍රථමක සංඛ්‍යාවක් වන ඉරට්ට සංඛ්‍යාව කුමක්ද?

(04) a) i. නිමාලිගේ පියා රැකියාව සඳහා පෙ.ව. 7.45 ට නිවසින් පිටත් ව නැවත ප.ව. 5.30 ට නිවසට පැමිණියේය. ඔහු නිවසින් පිටත ගත කළ කාලය සොයන්න. (

ii. සුළු කරන්න.

	දින	පැය
	5	13
+	6	18

	පැය	මිනිත්තු
	18	20
-	6	34

b) කුසල්ට තම නිවස අසල පිහිටි කඩයට යාමට නිවසින් 50 m ක් උතුරු දිශාවට ගොස් නැවත 20 m ක් ගිණිකොණ දිශාවට ගමන් කල යුතු නම් මෙම තොරතුරු දළ රූප සටහනක දක්වන්න.

c) තිරස් තලයක තබා ඇති ගඩොල් කැටයක් රූපයේ දැක් වේ.



i.මෙහි තිරස් තල කීයක් තිබේද?

ii. රූපයේ සිරස් දාරයක් ලකුණු කරන්න.

(05) (a) පහත දී ඇත්තේ සංඛ්‍යා රේඛාවක කොටසකි.



i. ඉහත රේඛාව මත 0, -3, 2 හා -2, යන නිඛිල ලකුණු කරන්න.

ii. එම නිඛිල ආරෝහණ පිළිවෙලට ලියන්න.

b) A සිට B ට දුර 2 m 35 cmවේ. B සිට C ට දුර 5m 70cmකි.



i. A සිට B හරහා C වෙත ගමන් කරන ළමයෙක් ගමන් කරන මුළු දුර සොයන්න.

ii. B සිට C තෙක් දුර, A සිට B දක්වා දුරට වඩා කොපමණ වැඩි ද?

c) සෘජුකෝණාස්‍රයක පළල 18c m කි එහි දිග, පළලට වඩා 2cm කින් වැඩිය.

i. දළ රූප සටහනක් ඇඳ, දී ඇති දත්ත ලකුණු කරන්න.

ii. සෘජුකෝණාස්‍රයේ පරිමිතිය සොයන්න.

(06) (a) i.වෘත්තයක් අඳින්න.

ii. වෘත්තය මත පිහිටි ලක්ෂ්‍යයක් × ලකුණින් ද වෘත්තය ඇතුළත පිහිටි ලක්ෂ්‍යයක් ● ලකුණින් ද වෘත්තයට පිටතින් පිහිටි ලක්ෂ්‍යයක් √ ලකුණින්ද දක්වන්න.

b)



ඉංග්‍රීසි හෝඩියේ ඇති A හා L අකුරු සම්බන්ධ කිරීමෙන් සෑදුණු රූපයක් මෙහි දැක්වෙයි. එම රූපය ඇසුරින් හිස්තැන් පුරවන්න.

i. අංක 6 න් දැක්වෙන්නේ .... කෝණයකි.

ii. අංක 1, ... හා .... මගින් සුළු කෝණ දැක්වෙයි.

iii. අංක 7 න් .... කෝණයක් දැක්වෙයි

iv. මහා කෝණ දැක්වෙන්නේ අංක.......... හා .... මගිනි.

v. අංක 8 න් දැක්වෙන්නේ .... කෝණයකි.

(07) a)



i. ඉහත සඳහන් සතුන්, ඔවුන්ගේ පොදු ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කරන්න.

ii. ඒ එක් එක් කාණ්ඩයට සුදුසු නම් දෙකක් යෝජනා කරන්න.

b) i. සංවෘත රූපයක් හා විවෘත රූපයක් අඳින්න.

ii. පහත නම් වලට ගැලපෙන රූපය යා කරන්න.

ඍජුකෝණාස්‍රය

සමචතුරස්‍රය

ත්‍රපීසියම

රොම්බසය